# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2023.05.18 |
| වේලාව | : | ප.ව. 2.30 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව |
| **මූලාසනය** | : | **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)** |

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | චන්දන රණවීර ආරච්චි මයා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) |
| 06) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 07) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 08) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 13) | ටී.එම්.අයි.යූ.එදිරිසිංහ මිය | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 14) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී,ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 15) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 16) | ඩී.ඩී.සී.සෙනවිරත්න මිය | - | අභ්‍යන්තර විගණක |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

<table>
<tr><th>අනු අංකය</th><th>කාරණය</th><th>තීරණය</th><th>ක්‍රියාත්මක කිරීමේ බලධාරියා</th></tr>
<tr><td>01</td><td>කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව</td><td>කාර්ය සාධන තරඟාවලිය සඳහා පහත වගුවෙහි දැක්වෙන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන 545 ක් හා සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන 37 ක් ලියාපදිංචි වී නොමැති බව වාර්තා කරන ලදී. ලියාපදිංචි වී නොමැති ආයතන සම්බන්ධව ආයතන ප්‍රධානීන්ගෙන් නිදහසට කරුණු විමසන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දැනුම් දුන් අතර අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් තරඟ සඳහා ලියාපදිංචි නොවූ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා විකල්ප තරඟාවලියක් පවත්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීමේ ඉදිරි වැඩ පිළිවෙල පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කළ අතර ලියාපදිංචි වී ඇති ආයතන වල ආසන්නතම අධීක්ෂණ නිලධාරීන් විසින් කාර්ය සාධන තරඟාවලිය සඳහා ලබා දී ඇති උපදෙස් පරිදි අංශ අධීක්ෂණය කර ලකුණු ලබා දීම සිදුකල යුතු බව ප්‍රකාශ කරන ලදී.<br>අධ්‍යාපන අමාත්‍යාංශය - ලියාපදිංචි නොවූ ආයතන
<table>
<tr><th>අනු අංක</th><th>කාණ්ඩය</th><th>සංඛ්‍යාව</th></tr>
<tr><td>1</td><td>ප්‍රාදේශීය/ කොට්ඨාශ මට්ටමේ ආයතන කාණ්ඩය</td><td>4</td></tr>
<tr><td>2</td><td>පළාත් සභා පාසල් (1AB)</td><td>55</td></tr>
<tr><td>3</td><td>පළාත් සභා පාසල් (1C)</td><td>132</td></tr>
<tr><td>4</td><td>පළාත් සභා පාසල් (Type 2)</td><td>188</td></tr>
<tr><td>5</td><td>පළාත් සභා පාසල් (Type 3)</td><td>166</td></tr>
<tr><td></td><td>එකතුව</td><td>545</td></tr>
</table>
සෞඛ්‍ය අමාත්‍යාංශය - ලියාපදිංචි නොවූ ආයතන
<table>
<tr><th>අනු අංක</th><th>කාණ්ඩය</th><th>සංඛ්‍යාව</th></tr>
<tr><td>1</td><td>දිස්ත්‍රික් මට්ටමේ ආයතන කාණ්ඩය</td><td>1</td></tr>
<tr><td>2</td><td>ප්‍රාදේශීය/කොට්ඨාශ මට්ටමේ ආයතන කාණ්ඩය</td><td>2</td></tr>
<tr><td>3</td><td>පළාත් රෝහල් කාණ්ඩය</td><td>17</td></tr>
<tr><td>4</td><td>පළාත් ආයුර්වේද රෝහල් කාණ්ඩය</td><td>17</td></tr>
<tr><td></td><td>එකතුව</td><td>37</td></tr>
</table></td><td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු</td></tr>
<tr><td>02.</td><td>නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව</td><td>ලැබී ඇති ප්‍රතිපාදන වලින් මේ වන විට ව්‍යාපෘතිවල 50% ක් පමණ ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලබයි. නමුත් නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ගත්කල වාහන නඩත්තු කටයුතු , යන්ත්‍ර සූත්‍ර නඩත්තු කටයුතු 50% ක් පමණක් සිදුකල නොහැකි බැවින් එය සම්පූර්ණ කර අවසන් කල යුතු බවටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් / මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව ගොඩනැගිලි නඩත්තු කටයුතු ආදිය 50%ක් සිදු කිරීමට කටයුතු කිරීමටත් වාහන යන්ත්‍ර සූත්‍ර ආදිය නඩත්තු සිදුකර අවසන් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.</td><td>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු</td></tr>
</table>



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 03. | මෙතෙක් ක්‍රියාත්මක නොවූ ස්ථාන මාරු සම්බන්ධව | 2023 වර්ෂයේ ක්‍රියාත්මක නොවූ ස්ථාන මාරු සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර වහාම ක්‍රියාත්මක වන පරිදි, ස්ථාන මාරු ලබා දී ඇති කාර්යාල වලට මෙතෙක් වාර්තා කර නොමැති නිලධාරීන් අදාළ දිනවලදී කාර්යාල වලට වාර්තා කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු)<br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 04. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | 2023 වසර තුල ව්‍යාපෘති 50% ක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් රුපියල් මිලියන 191 ක්ද , උපමාන පාදක සංවර්ධන පදාන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 22.3 ක මුදලක් ලැබී ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු දක්වන ලදී.<br>අමාත්‍යාංශ වලින් අත්‍යාවශ්‍ය බවට බවට සඳහන් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම් දී ඇති අතර ලැබී ඇති ප්‍රතිපාදන වලින් එම ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන ලෙසත් , ව්‍යාපෘති සිදුකර මුලින් බිල්පත් ඉදිරිපත් කරන අමාත්‍යාංශ වලට මුදල් ලබා දීමේදී ප්‍රමුඛත්වයක් ලබා දෙන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් දන්වා සිටින ලදී.<br>පරිපූරක ඇස්තමේන්තු සඳහා කටයුතු කිරීමට සියලුම අමාත්‍යාංශ වලට රුපියල් මිලියන 460 ක ව්‍යාපෘති සිදු කිරීම සඳහා දැනුම් දී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් දන්වා සිටින ලදී.ඒ අනුව අනිසුත් පරිපූරක ඇස්තමේන්තුවලට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සාකච්ඡා කිරීමට කමිටුව රැස්වීමට කටයුතු කරන ලෙසත් ඉන්පසු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා එම ඇස්තමේන්තු කමිටු නිර්දේශ සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br>ආණ්ඩුකාරතුමා විසින් ව්‍යවස්ථාපිත ආයතන සඳහා ලබා දෙන ප්‍රතිපාදන සම්බන්ධව ගිවිසුමක් සකස් කිරීම පිළිබඳ සාකච්ඡා කළ අතර එම ගිවිසුම කෙටුම්පත් කරමින් පවතින බව ප්‍රධාන නීති නිලධාරී විසින් සඳහන් කරන ලදී.<br>තවද ලැබී ඇති ප්‍රතිපාදන වලින් අනුමත ව්‍යාපෘති කඩිනමින් සිදු කර මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් , පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් ප්‍රතිපාදන ලබා දුන් ව්‍යාපෘති සිදු කරගෙන යන නමුත් පළාත් සංවර්ධන ප්‍රදාන මඟින් ප්‍රතිපාදන ලබා දුන් ව්‍යාපෘති සිදු කිරීමේ හා බිල්පත් ඉදිරිපත් කිරීමේ මන්දගාමී බවක් දක්නට ලැබෙන අතර කඩිනමින් ප්‍රතිපාදන ලැබී ඇති අනුමත ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ හා ප්‍රධාන ලේකම් වරුන්ගේ රැස්වීමේදී පළාත් සභා වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමසා බැලූ බවත් එය සතුටුදායක මට්ටමේ නොපැවතීම සම්බන්ධව එහිදී සාකච්ඡාවට ලක්වූ බවද පෙන්වා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ සැලසුම්) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 05. | පළාත් පාලන අමාත්‍යාංශයේ කොළඹ දිස්ත්‍රික් කාර්යාලය බස්නාහිර පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත කිරීම සම්බන්ධව | පළාත් පාලන අමාත්‍යාංශයට අයත් කොළඹ දිස්ත්‍රික් කොමසාරිස් කාර්යාලය මේ වන විට ස්ථාපිත ගොඩනැගිල්ල සඳහා ගෙවීමට සිදුවන කුළී මුදල අධික බැවින් එම කාර්යාලය සඳහා දැනට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටි ස්ථානයේ ස්ථාපිත කිරීමට ඇති හැකියාව සම්බන්ධව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු විමසන ලදී.<br>එහි ඉඩකඩ ප්‍රමාණවත් වන්නේද යන්න පරීක්ෂා කර බලන ලෙසත් මීට පෙර මේ සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයද ඉල්ලීම් ඉදිරිපත් වී ඇති බවත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරනා ලදී.<br>ඉල්ලීම් සලකා බලා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ඉන් ඉවත් වූ පසු ඉඩකඩ වෙන්කර දෙන බවත් කුමන ආයතනයකට වෙන් කිරීම සිදු කලද ප්‍රධාන ශ්‍රවණාගාරය වෙත පිවිසෙන පිවිසුම් දොරටුව කාර්යාලයේ සිට ශ්‍රවණාගාරයට ඇතුල් වීමට හැකිවන පරිදි සකස් විය යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |
| 06. | HRMSපද්ධතියට තොරතුරු ඇතුලත් කිරීම සම්බන්ධව චක්‍ර ලේඛයක් නිකුත් කිරීම | පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත අනුව ප්‍රධාන ලේකම් තොරතුරු පාලක ලෙස විස්තර කර ඇති අතර එම පනතෙහි 7,8,9,10 යන වගන්ති අනුව මෙම ක්‍රියාවලිය පවත්වාගෙන යා යුතුවේ. HRMS පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව චක්‍රලේඛයක් කෙටුම්පත් කිරීමට උපදෙස් ලැබී ඇති අතර නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් කිරීම සඳහා එම චක්‍රලේඛය මඟින් බලය පවරනු ලබයි.නමුත් චක්‍රලේඛය නිකුත් කිරීමට ප්‍රථම දත්ත ඇතුලත් කර ඇති අතර මෙම පද්ධතිය සම්බන්ධව වගකිවයුතු ආයතනයකින් සහතිකයක් ලබාගෙන නොමැති බවට ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>තම පෞද්ගලික තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම සම්බන්ධව ඇතැම් නිලධාරීන්ගේ විරෝධතා එල්ලවී ඇති බවත් ඒ අනුව කඩිනමින් චක්‍රලේඛය කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ ප්‍රධාන නීති නිලධාරී විසින් පෙන්වා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු)<br>ප්‍රධාන නීති නිලධාරී |
| 07. | කෘෂි සේවා අධිකාරිය වෙත ලබා දී ඇති වෙළඳ කුටියක් ආපසු පවරා ගිනීම සම්බන්ධව | කෘෂි සේවා අධිකාරිය වෙත ලබා දී ඇති වෙළඳ කුටි දෙක අතරින් එක් කුටියක් මේ වන විට භාවිතා නොවන බැවින් බාහිර ආයතන විසින් වෙළඳාම් කටයුතු සඳහා වෙළඳකුටි තාවකාලිකව ලබා ගැනීමට ඇති ඉල්ලීම් ද ඉහළ ගොස් ඇති බැවින් එම වෙළඳ කුටිය බාහිර පාර්ශව වෙත දෛනිකව ලබා දීම සඳහා ආපසු ලබා ගැනීම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව බස්නාහිර පළාත් සභාවට අයත් ආයතනවල සුභසාධක සංගම් හරහා බාහිර ආයතන වල වෙළඳ කටයුතු සඳහා එම කුටිය ලබා දීමට කෘෂි සේවා අධිකාරිය වෙතින් එක් වෙළඳ කුටියක් ආපසු ලබා ගැනීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් අනුමැතිය ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 08 | ප්‍රධාන ලේකම් හා ගරු ආණ්ඩුකාරතුමා අතර ඇති කරන ලද කාර්ය සාධන ගිවිසුමට සමගාමීව ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් අතර කාර්ය සාධන ගිවිසුමක් සකස් කිරීම | ජනාධිපති ලේකම්ගේ 2022.12.28 දිනැති ලිපියේ දක්වා ඇති පරිදි ගරු ආණ්ඩුකාරතුමා හා ප්‍රධාන ලේකම් අතර කාර්ය සාධන ගිවිසුමක් ඇතිකර ගැනීමට උපදෙස් ලැබී ඇති අතර එය මේ වන විට අත්සන් කර ඇති බැවින් ඊට සමගාමීව අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගෙන්ද ප්‍රධාන ලේකම් සමඟ ගිවිසුමකට අත්සන් කිරීමේ අවශ්‍යතාවය ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙනු ලදී.මෙම කාර්ය සාධන ගිවිසුමේ කරුණු අධ්‍යයනයකර අමාත්‍යාංශ වලට අදාළ වන පරිදි ගිවිසුම සකස් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 09 | ව්‍යාපෘති සෘජුවම ප්‍රාදේශිය ඉංජිනේරුවරුන් වෙත පැවරීම නිසා ඇති වී ඇති ගැටළු සම්බන්ධව | අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක වන ඉංජිනේරු අංශයට යොමුවිය යුතු ව්‍යාපාති සෘජුවම ප්‍රාදේශීය ඉංජිනේරුවන් වෙත පැවරීම නිසා ගැටළු මතුවී ඇති බැවින් අමාත්‍යාංශ වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉංජිනේරු අංශය හරහා ප්‍රාදේශිය ඉංජිනේරුවන් වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසත් එසේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු අධීක්ෂණය නොමැතිව සෘජුවම ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාල වෙත යොමුවන ව්‍යාපෘති සම්බන්ධව ඇතිවන ප්‍රමාදයන් සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ වගකීමක් නොමැති බවත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| 10 | සභා ලේකම් කාර්යාලයේ කළමනාකරණ සේවා නිලධාරීන් වෙනත් ආයතන සඳහා අනුයුක්ත කිරීම සම්බන්ධව | සභා ලේකම් කාර්යාලයේ දැනට සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරීන් නැවත සභාව රැස්වන තෙක් වෙනත් ආයතන සඳහා අනුයුක්ත කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව කළමනාකරණ සේවා නිලධාරීන් හය දෙනෙකු ලබාදිය හැකි බව සභා ලේකම් විසින් දන්වන ලදී.<br>ඒ අනුව එම නිලධාරීන් අවශ්‍යතාවය මත සේවා ස්ථාන සඳහා අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 11 | බස්නාහිර පළාත් සභාවට අයත් ගොඩනැගිලි පවරා ගැනීම සම්බන්ධව | අවිස්සාවේල්ල නගරයේ පිහිටි සබරගමු බස් සමාගම විසින් භාවිතා කරනු ලබන බස්නාහිර පළාත් සභාවට අයත් ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට කර ඇති ඉල්ලීම පිළිබඳ සාකච්ඡා විය. එම ගොඩනැගිල්ලෙහි බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාලයක් ස්ථාපිත කිරීමට ඇති හැකියාව සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) විසින් පෙන්වා දෙන ලදී.<br>තවද එම භූමියේම පිහිටා ඇති නිල නිවාස වල දැනට සෞඛ්‍ය අංශයට අයත් නිලධාරීන් පදිංචිව සිටින බැවින් ඒවා සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් සෞඛ්‍ය ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>මේ සඳහා සබරගමු බස් සමාගමේ නිලධාරියෙකු හා වෙනත් අදාළ නිලධාරියෙකු සමඟ සාකච්ඡාවක් සූදානම් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) වෙත දන්වන ලදී. | ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 12 | ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා දීමනාවක් ගෙවීම සම්බන්ධව | ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් හා ගණකාධිකාරීවරුන් වෙත පළාත් සභා රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් දැනට ගෙවනු ලබන දින වැටුප් දෙකට අමතරව තවත් අමතර දින වැටුප් දෙකක් ගෙවීම සම්බන්ධව ආණ්ඩුකාර ලේකම් විසින් කරුණු දක්වන ලද අතර ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කළ බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූලා) ආණ්ඩුකාර ලේකම් |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත